# සාගර සම්පත විනාශය හා කැස්බෑ සංරක්ෂණය

මනෝජා ජයසේකර
පරිසර අමාත්‍යාංශය

කාර්මීකරණයත් සමගම විසි වන සියවසේ සිට සංකීර්ණ මිනිස් අවශ්‍යතා හේතුවෙන් දිනෙන් දින පරිසර පද්ධතියට පරිසර දූෂණ කාරක ලෙසින් ඝන ද්‍රව හා වායු යන ත්‍රිවාධාකාරයෙන් ම රසායනික ද්‍රව්‍ය එකතු වේ. පෘථිවියේ ගොඩබිම් කොටස වන ශිලා ගෝලය හා ගංගා ඇලදොලවලින් සමන්විත ජල ගෝලය ද විවිධ වායුන්ගෙන් සංතෘප්ත වුනු වායු ගෝලය ද මේ වන විට දැඩි ලෙසින් විනාශ වෙමින් පවතී. වර්තමානයේ පෘථිවි උණුසුම ද 0.4 c° - 0.8 c° දක්වා වැඩි වෙමින් පවතී.

මෑතක සිට ගෝලීය උණුසුම වැඩි වීමට හේතු වී ඇති ඕසෝන් ක්ෂයකාරක වායුන් වන CFC (ක්ලෝරෝ ප්ලෝරෝ කාබන්) හේලෝන්, $CH_4$ (මීතේන්) $N_2O$ නයිට්‍රජන් ඔක්සයිඩ් සාධක නිසා ජෛව විවිධත්වයද දිනෙන් දින අඩු වී ඇත. මන්ද හරිතාගාර ආවරණය මගින් පරිවර්ථී ගෝලයේ ජීවීන්ගේ පැවැත්මට බෙහෙවින් තර්ජන එල්ල වී ඇත. ඕසෝන් ස්ථරය ක්ෂය වීම නිසා ද UV (අල්ට්‍රාවයලට්) කිරණ පොළොවට පතිත වේ. එහි ප්‍රතිඵලයක් ලෙස සාගරයේ ශාක හා සත්ත්ව ප්‍රජාවන්ට හානි වේ. තවද සාගරයේ ගැඹුරට ගමන් කරන මෙම UV කිරණ හේතුවෙන් සාගරයේ වර්ණවත් කොරල් පර විරංජනය වේ. තවද සාගර පද්ධතියේ ආහාර නිෂ්පාදනය කෙරෙහි වැදගත් වන ශාක ප්ලවාංග හා ඇල්ගී විශේෂයන්ට ද හානි සිදු වීම නිසා ජලජ ආහාර දාමයන් බිඳ වැටීම ද සිදු වේ.

උෂ්ණත්වය ඉහළ යෑම හේතුවෙන් පෘථිවියේ ඇන්ටාටික් හා ආක්ටික් ධ්‍රැව ප්‍රදේශවල ග්ලැසියර් කඳු දිය වී යෑම නිසා සාගරයේ ජල මට්ටම ඉහළ යෑම ගංගා ඇලදොලවල ජල මට්ටම ඉහළ යෑම සමුද්‍ර ඛාදනය තුලින් ගොඩබිම මුහුදට සෝදා යෑම පාදක කර ගනිමින් ගොඩබිම් පරිසර පද්ධතිවල ජීවත් වන ජීවී ගහණයන් වඳ වී යෑම වැනි ගැටළු ද පැන නගී. එසේම වෙරළ ඛාදනය සමග ඇති වන අධික රොන් මඩ කොරල් මත තැන්පත් වීමත් සමග ඒවා ඉවත් නොකිරීම නිසා කොරල්පර විනාශ වේ. ජලයේ කාබන්ඩයොක්සයිඩ් වැඩි වීම නිසා කාබනික අම්ල වැඩි වීම කොරල් විනාශ වීමට හේතු වේ. අඩු PH අගය හේතුවෙන් කැල්සිකරණය අඩු වී කොරල් පර හා ජීවීන්ගේ වර්ධනය ද අඩු වේ. එම හේතුවෙන් තුඹාවන් හා කවච දරන්නන්ගේ බිත්තර මුහුදු ජීවීන්ගේ කවචවලට ද හානි සිදු වේ. ජීවීන් වඳ වී යෑමේ ප්‍රවණතාවය ද වැඩි වේ. සාගර පරිසර පද්ධති තුළ දියවැල් රටා වෙනස් වීම ද සාගර ජීවීන් කෙරේ බලපෑම් ඇති කරයි. පරිසර දූෂක කාරක බැරලෝහ වන ලෙඩ්ද, ක්ලෝරයිඩ්, ෆ්ලෝරයිඩ් ද කාබන් හා අනිකුත් හරිතාගාර වායු හා ප්ලාස්ටික් වර්ග ඝෂ්පුවම හෝ වක්‍රාකාරව දේශගුණ විපර්යාස තීව්‍ර කිරීම හා එමගින් කොරල් හා ආශ්‍රිත ජීවීන් විනාශ කිරීමට හේතු වී ඇත.

මිනිස් ක්‍රියාකාරකම් මෙන්ම පරිසර සාධක හා රසායනික සාධක හේතුවෙන් විනාශ වී යන සත්ත්ව කාණ්ඩ අතරින් ලොව ආන්දෝලනයට පත්ව ඇති ජීවී විශේෂයක් වන කැස්බෑවුන්ට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. එබැවින් එම සත්ත්ව කාණ්ඩය පිළිබඳව විමසා බැලීම ද කාලෝචිතය. ලෝකයේ මේ වන විට කැස්බෑ විශේෂ 07ක් හඳුනාගෙන ඇති අතර දැනට ශ්‍රී ලංකාවේ විශේෂ 05ක් හමු වේ.

## ශ්‍රී ලංකාවේ හමුවන කැස්බෑවුන්

01. දාර කැස්බෑවා (Leatherback Turtle)

කැස්බෑවුන් අතරින් විශාලතම විශේෂය වන අතර බරින් කි.ග්‍රෑ. 500ක් පමණ වේ. පිටකටුව ඇදෙන සුළු නම්‍යශීලී වේ. මෙම කැස්බෑවුන්ගේ පිටෙහි දාර 05ක් ඇති බැවින් එම නම ලැබී ඇත. උග්‍ර ලෙස වඳ වී යයි. ශ්‍රී ලංකාව ඇතුළු නිවර්ථන කලාපයේ හමු වේ. ලොඩියන් හා ජෙලි මසුන් මත බහුලවම යැපෙන මොවුන් ලෝකයේ බහුලවම හමු වන විශේෂයකි.



දාර කැස්බෑවා

02. බටු කැස්බෑවා (Olive Ridley Turtle)

බටු කැස්බෑවා කුඩා දේහයක් දරයි. මොවුන්ගේ බර කි.ග්‍රෑ. 40යි. මොවුන් සර්ව භක්ෂක වන අතර ශ්‍රී ලංකාව ඇතුළු නිවර්ථන කලාපීය ඉන්දීය පැසිපික් හා දකුණු අත්ලාන්තික් සාගර ප්‍රදේශයෙන් හමු වේ.



බටු කැස්බෑවා

03. පොතු කැස්බෑවුන් (Hawksbill Turtle)

පොතු කැස්බෑවා බරින් කි.ග්‍රෑ. 60ක් වන මොවුන්හට උකුසු හොටක් ඇත. මාංශභක්ෂකයින් වන මෙම කැස්බෑවුන් ශ්‍රී ලංකාව ඇතුලු නිවර්ථන කලාපයේ හමු වේ.



පොතු කැස්බෑවා

04. ඔළුගෙඩි බැස්බෑවුන්. (Logger Head Turtle)

තමාවුන්ගේ දේහ බර කි.ග්‍රෑ. 180කි. විශාල හිසක් පිහිටි බැවින් මෙම නම ලැබී ඇත. මූලික වශයෙන් මාංශ භක්ෂකය. ශ්‍රී ලංකාව ඇතුලු සර්ම කලාපීය වෙරළේද මධ්‍ය ධරනී මුහුදේ හා ගිණිකොණ දිග වෙරළේ හමු වේ.



ඔළුගෙඩි කැස්බෑවා

05. ගල් කැස්බෑවුන්. (Green Turtle)

මොවුන්ගේ දේහ බර කි.ග්‍රෑ. 230කි. බාහිරින් පිහිටි කවචයට යටින් කොළ පැහැති මේද ස්ථරය ඇත. කුඩා කාලයේදී සර්ව භක්ෂකයින් වන මොවුන් පසුව ශාක භක්ෂකයින් බවට පත් වේ. ශ්‍රී ලංකාව ඇතුලු නිවර්ථන අත්ලාන්තික් ශාන්තිකර සාගර කලාපයේ හමු වේ.



ගල් කැස්බෑවා

## ශ්‍රී ලංකාවේ හමු නොවන කැස්බෑවුන්

06. පැතලි පිටැති කැස්බෑවා (Flat Back Turtle)

මොවුන් මුහුදු පැළෑටි හා ඇතැම් මත්ස්‍යය විශේෂ ආහාරයට ගනී. බිත්තර දැමීම ඕස්ට්‍රේලියාවේ සිදු වන අතර ටෝරීස් සමුද්‍ර සන්ධියේ හා ක්වීන්ස්ලන්තයේ හමු වේ. ශ්‍රී ලංකාවෙන් වාර්තා වී නැත. කැස්බෑවුන්ගේ දේහ බර 70kg ක් පමණ වේ.



පැතලි පිටැති කැස්බෑවා

07. කළු බැස්බෑවා (East pacific green or Black Turtle)

මුහුදු පැලෑටි හා බෙල්ලන් ආහාරයට ගනී. ශාන්තිකර සාගරයේ ජීවත් වේ.



කළු කැස්බෑවා

සාගර තෘණ භූමි උලා කෑම හා ඇතැම් සාගර මත්ස්‍ය ජීවීන් ආහාරයට ගනිමින් ජීවත් වන කැස්බෑවුන් ගහණ පාලනයට ද වැදගත් වේ.

වර්තමානයේ වඳ වී යන සත්ත්ව කාණ්ඩයක් වන මොවුන්ගේ ලිංගික පරිණතිය ද සුවිශේෂී ලක්ෂණ වලින් යුක්ත වූවකි. ලිංගික පරිනතිය සඳහා වසර 15 - 30 ක් පමණ ගතවන අතර ඇතැම් විශේෂ සඳහා වසර 50ක් ගත වේ. අභිජනනය නොගැඹුරු ජලයේදී සිදුවන අතර බිත්තර දැමීම වෙරළ තීරයේ සිදු වේ. වරකට බිත්තර 100 - 120 ක ප්‍රමාණයක් දමයි. කැස්බෑවියන් බිත්තර දැමීමට ප්‍රථම වෙරළ පරීක්ෂා කරනු ලබන අතර බිජුලෑම සඳහා රාත්‍රී කාලය තෝරා ගනී. කැස්බෑවිය බිත්තර දැමීමට ප්‍රථම අවල්පත් යොදා ගනිමින් වෙරළේ ගැඹුරු රවුම් වළක් හාරනු ලබයි. ඉන් පසුව මහා වළ තුළ කුඩා වලක් හාරා ගනු ලබන අතර ඒ තුළ බිත්තර දමනු ලබයි. බිජුලෑමෙන් පසුව වැලි දමා වසනු ලබයි.

දින 60ක කාලයකට පසුව බිත්තරයෙන් එළියට එන කැස්බෑ පැටවුන් රාත්‍රී කාලයේදීම වෙරළෙන් සාගරයට පිවිස පැය විසි හතරක් පුරා නොනවත්වා ගැඹුරු සාගරයට පිහිනා යනු දැකිය හැක. මේ සඳහා උපරිම ශක්තිය යොදා ගන්නා අතර මෙම ක්‍රියාවලියට "ළදරු උන්මාදය" යැයි කියනු ලබයි.

ශ්‍රී ලංකාව තුළදී කැස්බෑ විශේෂ 05ක් හඳුනා ගැනීමට ලැබීම හා දකුණු දිග වෙරළ තීරය කැස්බෑවුන් බෝ වීම කෙරෙහි සුවිශේෂ ස්ථානයක් වී තිබීම නිසා ලෝක සංරක්ෂණ සංගමයේ ශ්‍රී ලංකා ශාඛාව පවසන පරිදි කැස්බෑ කැදලි ස්ථානීය සංරක්ෂණය සඳහා කොස්ගොඩ, රැකව, කහඳමෝදර, ගොඩවාය, සහ බූන්දල යන ස්ථාන හඳුනාගෙන ඇත. ඒ අතරින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සංගණනයන්ට අනුව වැඩිම දාර කැස්බෑ කැදලි වාර්තා වී ඇත්තේ ගොඩවාය ප්‍රදේශයෙනි. එබැවින් කැස්බෑ සංරක්ෂණයේ ස්ථානීය සංරක්ෂණ ක්‍රමෝපායක් ලෙස 2006.05.25 දිනැති අංක 1446/25 දරණ ගැසට් පත්‍රයෙන් ගොඩවාය ස්ථානීය සංරක්ෂිත අභයභූමියක් ලෙස සංරක්ෂණය කරන ලදි.

කැස්බෑවුන්ට මිනිසා විසින් ඇති කරන තර්ජන

- මිනිස් අවශ්‍යතා මත වෙරළ තීරයේ වැලි ඉවත් කිරීම නිසා බිත්තර දමන ස්ථාන විනාශ වීම සහ මුහුදට ගසාගෙන යෑම.

- වෙරළාශ්‍රිත හෝටල් ඉදිකිරීම් හේතුවෙන් නිකුත්වන දීප්තිමත් ආලෝකය නිසා කැස්බෑවුන්ට රාත්‍රී කාලයේ බිත්තර දැමීම සඳහා වෙරළට පැමිණීමට බාධා ඇති වේ.

- මාළු දැල්වල පැටලී මියයෑම.

- බිත්තර සහ මස් පිණිස දඩයම් කිරීම.

- හිරිගල්පර විනාශ කිරීම.නිසා වාසස්ථාන අහිමිවීම.



සාගර කැස්බෑවුන්ගේ පරිණතිය සහ බිත්තර දැමීමේ චර්යාව

තෙල් විසිරීම්, රසායනික ද්‍රව්‍ය සාගරයට මුදා හැරීම, කැලි කසල මගින් සාගර දූෂණය , පොලිතින් ආදිය නිසා කොරල් පර මත වාසය කරන ජීවීන් විනාශ වී යෑම නිසා කැස්බෑවුන්ගේ ආහාර රටා බිඳී යෑම.

සාගරය වනාහී මිහිතලය මත පවතින සියලු ජීවී ප්‍රජාවන්ගේ පැවැත්මට මහෝපකාරී වන මිල කල නොහැකි සම්පතක් බැවින් මිනිසාගේ අදූරදර්ශී ක්‍රියාකාරකම් හේතුවෙන් සිදු කරන විනාශයන් හේතු කොටගෙන සාගරයෙන් සම්භවය වූ ජීවියා සාගරය විසින්ම බිලි ගන්නා කාලය ද වැඩි ඈතක නොවනු ඇත. එබැවින් එය සුරැකීම අප සැමගේම යුතුකමකි.


තොරතුරු මූලාශ්‍ර

අන්තර්ජාලය

ත්‍රෛමාසික සමුදුරු පුවත් කලාපය 2010

ඕසෝන් විත්ති 2009 කලාපය